## Australian Humanitarian Overseas Medal to a Sri Lankan Doctor in Melbourne Australia



Pictured above is Dr Thanuja Katugampala in Melbourne, Australia, receiving "Humanitarian Overseas Service Medal" from Prof. David De Krester, the Governer of Victoria, for the work she has undertaken as part of Australia-Sri Lanka Medical Aid Team (AuSLMAT). This medal honours members of recognized Australian groups which render humanitarian service overseas in hazardous circumstances.

These voluntary doctors immediately responded to the Country's need for help in a desperate situation, and went to Sri Lanka within 3days after Tsunami struck. Dr Thanuja Katugampala was one of the members of that team. She went to Galle with Dr Quintus De Zylva and other members of the team of voluntary doctors worked relentlessly in all the temporary camps along the southern coastline of Sri Lanka. Since that time, AuSLMAT has made several trips to Sri Lanka and have taken over millions of dollars worth Medical equipment to Galle, Hambantota, Ampara and Baticaloa areas.

## ක්‍රිකට් ලෝක කුසලාන 2007

### සියලු බලාපොරොත්තු සනත් මත ද?



ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම මෙවර ලෝක කුසලාන තරගාවලියට සහභාගි වන්නේ අවිනිශ්චිත ප්‍රතිඵල සමගින් ය. මේ තරගාවලියේදීත් සියලු බලාපොරොත්තු සුපිරි



ක්‍රීඩක සනත් ජයසූරිය හා මුත්තයියා මුරලිදරන් මතම පැවරේදැයි අපි බලා සිටිමු.

### ICC World Cup, 2006/07 Fixtures Sri Lanka

March 2007
Thu 15
4th Match, Group B - Bermuda v Sri Lanka
Queen's Park Oval, Port of Spain, Trinidad

Wed 21
16th Match, Group B - Bangladesh v Sri Lanka
Queen's Park Oval, Port of Spain, Trinidad

Fri 23
20th Match, Group B - India v Sri Lanka
Queen's Park Oval, Port of Spain, Trinidad

## රන් ස්වර ධාරා ඩීවීඩී තැටිය නිකුත්වෙයි

(රුක්මන් විමලසූරිය විසිනි)




වසර 2004 මාර්තු 7 වෙනිදා මෙල්බන් කොන්සට් ශාලාවේදී, 2,300 ක වාර්තාගත ප්‍රේක්ෂක පිරිසක් එකට වාඩිවී රස විඳි දැවැන්ත සංගීත ප්‍රසංගයයි, රන් ස්වර ධාරා. එඩ්වඩ් ජයකොඩි, සුනිල් එදිරිසිංහ, නන්දා මාලිනී, නිරෝෂා විරාජිනී සහ රෝහණ වීරසිංහ එකට ගී ගැයූ, 13 දෙනෙකුගෙන් යුත් දක්ෂ වාදක මඬුල්ලක් විසින් මනහර සංගීතය සැපයූ මෙම ප්‍රසංගය, ඔබ මතකයේ සදා රුඳෙනු නොඅනුමානයි.

මෙම ප්‍රසංගය නරඹනු ලැබූ මෙන්ම ඒ සඳහා අවස්ථාවක් නොලද බොහෝ දෙනාගේ ඉල්ලීම පරිදි, පැය හතරක් පුරා ගීත 50 ක් පමණ ගායනා කෙරුණු රන් ස්වර ධාරා මහා සංගීත ප්‍රසංගය, අගනා ඩී.වී.ඩී. තැටියක් ලෙස එළි දැක්වී ඇත. අප සංගීත ලෝලීන්ට උපරිම මට්ටමේ ආශ්වාදයක් ලැබිය හැකි වන සේ තිබුණු සුළු අඩුපාඩු නිසි පරිදි පිළිසකර කර සංස්කරණය කිරීමට, සෑහෙන කලක් ගත වී ඇත.
රන් ස්වර ධාරා ඩී.වී.ඩී. තැටිය දොරට වැඩීමේ උත්සවය, පසුගිය පෙබරවාරි මස 24 වෙනි සෙනසුරාදා, එම දැවැන්ත ප්‍රසංගය ඔබ වෙත ඉදිරිපත් කරන ලද වික්ටෝරියානු ආදි ආනන්දීයයන්ගේ සංගමයේ වාර්ෂික සුහද හමුවේදී පවත්වන ලදී. තරංගා වාදක මණ්ඩලය මෙහෙයවනු ලබන කැමරන් කොළඹගේ ඇතුළු ආරාධිතයින් කිහිප දෙනෙකුත්, සංවිධායකයින් කිහිප දෙනෙකුත් එකට එකතු වී චිරාගත පොල් තෙල් පහණ දැල්වීමෙන්, මෙම චාම් උත්සවයේ කටයුතු ඇරඹිණ.

ඉන් අනතුරුව, වික්ටෝරියානු ආදි ආනන්දීයයන්ගේ සංගමයේ වර්තමාන සභාපති ලලිත් ප්‍රනාන්දුගේ ආරාධනයෙන්, එම වසරේ සභාපති වූ රෝහිත බෝගහවත්තගේ සහ ප්‍රසංගයේ ප්‍රධාන සංවිධායක හර්ෂ බණ්ඩාර විසින් ප්‍රථම ඩී.වී.ඩී. තැටිය පිළිගන්වන ලද්දේ, ආනන්ද විද්‍යාලයේ හිටපු විද්‍යාලපති කර්නල් වී. එස්. කුඩලිගම මහතා වෙතයි.
එදින රන් ස්වර ධාරා ඩී.වී.ඩී. තැටිය මිළදී ගෙන නරඹනු ලැබූවන්ගෙන් දැනට ලැබෙමින් පවතින ප්‍රතිචාරය වන්නේ, ශ්‍රව්‍ය සහ දෘශ්‍ය යන අංශ දෙකින්ම මෙම ඩී.වී.ඩී. තැටිය, වෙළඳ පොළේ අලෙවි වන සාමාන්‍ය ඩී.වී.ඩී. තැටි වලට වඩා ඉතාමත් උසස් මට්ටමක පවතින බවයි. තවත් නොබෝ දිනකින්, සියළුම ශ්‍රී ලාංකික වෙළඳසැල් වලින් ඔබට මෙම උසස් මට්ටමේ ඩී.වී.ඩී. තැටිය මිළ දී ගත හැකි වනු ඇත.

## මැති ඇමතිවරු වෙනුවට අපේ දුවක්



වික්ටෝරියා ප්‍රාන්තයේ ලින්බෲක් (Lynbrook) ප්‍රදේශයේ අළුතින් ගොඩ නගා මෙම මස 17 වෙනි සෙනසුරාදා විවෘත කිරීමට නියමිත ලින්බෲක් විලේජ් (Lynbrook Village) නැමති නව වෙළඳ සංකීර්ණයේ නිල වශයෙන් කෙරෙන පීත්ත පටිය කැපීම සඳහා අපේ ම දැරිවියක් තේරී පත්වී සිටී එය අප කාහටත් සතුට ට කරුණක් මෙන්ම මෙහි පවතින සමාජ ගත උසස් ගුණයක් වන සමානාත්මතාවය මොනවට විදහා පාන්නකි

ඇය නමින් තිළිණි රණසිංහ ය ලින්බෲක් ප්‍රාථමික පාසැලේ (Lynbrook Primary School) 6 වෙනි ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඇය පාසැල් නායිකාව ද (School Captain) වන්නීය නව පාසැලට ඇතුළුව අවුරුදු දෙකක් පමණ සුළු කාලයක් ඇතුළත දී ගුරුමණ්ඩලය ඇතුළු අනිකුත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ප්‍රසාදය දිනා ගත් ඇය දීප්තිමත් ශිෂ්‍යාවකි

ඇයට අපගේ සුබ පැතුම්

## බටනලා සංගීත සැඳෑව

(රුක්මන් විමලසූරිය විසිනි)



ශ්‍රී ලංකාවේ සුප්‍රකට සංගීතවේදී, බටනලා සහ එස්රාජ් වාද්‍ය විශාරද, ශාස්ත්‍රපති අනිල් මිහිරිපැන්න ශූරීන් විසින් ඉදිරිපත් කෙරුනු මනහර සංගීත සැඳෑවක්, පෙබරවාරි මස 18 වෙනි ඉරුදින සවස 5:00 ට, Glen Waverley hQ Black Flat Community Centre හිදී පැවැත්වුනි. ශ්‍රී ලංකාවේ සිට පැමිණි නන්දන විජේනාම තබ්ලා වාදනයෙන්ද, චමිලා එඩ්වඩ් තාම්පුරා වාදනයෙන් සහ ගායනයෙන්ද, මෙල්බන්හි නාලක වීරකෝන් සර්පිනා වාදනයෙන්ද මෙම ප්‍රසංගයට සහාය වූහ.

සංගීත දැනුම සහ රසය වර්ධනය කර ගැනීමේ දුර්ලබ සහ මහඟු අවස්ථාවක් වූ මෙම සැඳෑවට, මෙල්බන් පෙරදිග සංගීත රසකාමීහු රාශියක් පැමිණ සිටියහ. එහිදී විශාරද මිහිරිපැන්න ශූරීන් විසින්, හින්දුස්ථානි සංගීතයේ එන රාග මෙන්ම තමන් විසින්ම නිර්මානය කරන ලද රාගයක් වන "සංකලන රාගයද", ලාංකික ජන සංගීත ඛණ්ඩ ඇතුලත් සුමිහිරි වාදනයක්ද බටනලාවෙන් ඉදිරිපත් කරන ලදී. මෙම කන්කළු බටනලා වාදන අතරතුරදී, ඔහු විසින් එක් එක් වාදනාංග පිළිබඳ කෙටි හැඳින්වීමක්ද කරමින්, කලාකාමී අසන්නන්ගෙන් පැන නැඟුනු නොයෙකුත් ප්‍රශ්න වලටද පිළිතුරු දෙන ලදී. චමිලාගේ බජන් සහ ලාංකික ගායනා කිහිපයත්, නන්දනගේ ඒකල තබ්ලා වාද්‍ය ඛණ්ඩත්, බටනලාව සහ තබ්ලාව අතරේ පැවැත්වුනු සංගීත සංවාදත් නිසා, මෙම ප්‍රසංගයට අගනා විවිධත්වයක් එක්වුනු සේය.

වාසනා වීරකෝන් විසින් පවත්වනු ලබන "සංඛ පද්ම" සංගීත අධ්‍යාපන ආයතනය මඟින් මෙම සංගීත සැඳෑව සංවිධානය කරන ලද්දේ, ජය ශ්‍රී චන්ද්‍රජිත්ගේ සහායෙන් සහ බන්දු දිසානායකගේ අනුග්‍රහයෙනි.



Come and Enjoy the Exquisite Spicy Sri Lankan Food at the

**Sri Lankan Food Night**

organised by the

**Sri Lankan Catholic Group in New South Wales**
**Entertainment by Bonny Fernando & Vijitha Keeniwinna**

When: 24 March 2007
Where: Roselea Community Centre Carlingford
Time: 4.00 pm to 10.00 pm

**The proceeds from the fair will be used for activities planned by the Sri Lankan Catholic Group in NSW and to assist charities in Sri Lanka**